# ශ්‍රී ලංකාවේ උසස් පෙළ පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාඵල්‍යතාවය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

කේ. ජී. කේ. ප්‍රභාෂ්

FGS/P/MSSc/2007/05

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1196 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2015 මාර්තු

# ශ්‍රී ලංකාවේ උසස් පෙළ පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාඵල්‍යතාවය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

කේ.ජී. කීර්ති ප්‍රභාෂ්

දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සංක්ෂිප්තය

ඉගෙනුම් ක්‍රියාවලිය පුද්ගල ජීවිතයේ ආරම්භයේ සිට අවසානය දක්වා දිව යන්නකි. චර්යාවාදී, ප්‍රජානනවාදී සහ මානුෂවාදී දෘෂ්ටිකෝණයන්ගෙන් "ඉගෙනුම" දෙස අවධානය යොමු කර ඇත. එම එක් එක් දෘෂ්ටිකෝණ අනුව ඉගෙනුම පිළිබඳ ඇති අර්තකථන ද වෙනස් වේ. සාපේක්ෂ වශයෙන් ස්ථාවර ලෙස චර්යාවේ සිදුවන වෙනස ඉගෙනුම වන බව චර්යාවාදීන්ගේ මතය වේ. සාපේක්ෂ ලෙස චර්යාවේ සිදුවන වෙනස තීරණය කිරීමට ප්‍රජානන සාධක වන බුද්ධිය, තර්කය, මතකය, චිත්තවේග, පරිකල්පනය වැනි සාධක හේතුවන බව ප්‍රජානනවාදී මතයයි. ඉගෙනුම ක්‍රියාවලියක් බැවින්, ඒ සඳහා බලපාන හේතු සාධක ගණනාවකි. දෙමාපිය හා පවුල් සාධක, ආයතන බද්ධ සාධක, පුද්ගල සහ ප්‍රජානන සාධක, විෂය බද්ධ සාධක ඒ අතර වේ.

ශ්‍රී ලංකාවේ අ.පො.ස. (උ/පෙළ) පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාපල්‍යතාවය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ පාසල් සිසුන්ගේ ඉගෙනුම් දක්ෂතා කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදු කරන සාධක හඳුනා ගැනීමය. මෙම අරමුණ සාර්ථක කර ගැනීම සඳහා සිදු කරන ලද පර්යේෂණය තුළ ඉගෙනුම් න්‍යායන් ආශ්‍රයෙන් න්‍යායාත්මක කරුණු අධ්‍යයනය කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස ගම්පහ දිස්ත්‍රික්කය තෝරා ගත්තේය. අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් සහ විභාගය අසමත් සිසුන් නියැදියට ප්‍රශ්නාවලියක් ලබා දීමෙන් දත්ත සපයා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමය ලෙස තුලනාත්මක පර්යේෂණ ක්‍රමය භාවිත කළේය.

ක්ෂේත්‍රයෙන් ලබා ගත් තොරතුරු විශ්ලේෂණය කිරීමකට භාජනය කළ අතර ඒ සඳහා සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමය යොදා ගත්තේය. තොරතුරු නිරූපණය කිරීමට Microsoft Office Excel 2007 පරිගණක මෘදුකාංගය යොදා ගන්නා ලදී.

පර්යේෂණයෙන් ලත් නිගමනයක් වන්නේ, ඉගෙනුම් සාඵල්‍යතාව කෙරෙහි විෂය බාහිර ක්‍රියාකාරකම් අහිතකර ලෙස බලපාන බවට පැවති මිත්‍යා මතය බිඳ වැටීමයි. අනෙක් අවධාරිත වැදගත් කරුන වන්නේ ඉගෙනුම් දක්ෂතා කෙරෙහි දෙමාපිය සහ පවුල් සාධකයේ මැදිහත්වීම ධනාත්මකව සිදු විය යුතු බවයි.

මුඛ්‍ය පදඃ- චර්යාවාදය, ප්‍රජානනවාදය, මානුෂවාදය, බුද්ධිය, තර්කනය, මතකය, චිත්තවේග

## A study of the factors affecting on learning performance of advanced level students in Sri Lanka

K.G.Keerthi. Prabhash

Department of Philosophy

E-mail: keerthiprabhash@yahoo.com

Abstract

Learning process comes from the beginning to the end of the life of a person. Learning process was seen in different perspectives such as, behavioral, cognitive and humanistic. According to each perspective the definitions of learning process is changed. The behaviorists believe that, stable behavioral changes are called as learning. Relatively, behavioral changes are decided through the factors such as, intelligence, logic, memory, emotions and imagination. As the learning is a process there are many factors that effect it. Parents and family factors, Institutional factors, Personal and cognitive factors and Subject factors are special among them.

The main objective of this study was to, identify the factors that effects positively for learning skills of advanced level students in Sri Lanka. The students who passed and failed the examination of Advance Level in Gampaha District Was selected as the sample of the study.

A questionnaire was used as the main method for data collection and collected data were analyzed using Microsoft Office Excel 2007 based on the findings.

Through the findings of the study, the myth of extra-curricular activities are adversely effect on the learning fertility is broken down.The other important factor is the positive involvement of parents and family should be on learning skills.

**Key words:** behavioral, cognitive, humanistic, intelligence, logic, memory, emotions